**බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ ප්‍රාථමික අංශයේ ප්‍රකාශනයකි.**


**5 වන ශ්‍රේණිය ශිෂ්‍යත්ව පෙරහුරු පරීක්ෂණය 2018**

**ප්‍රශ්න පත්‍ර අංක 01- I පත්‍රය**

**විභාග අංකය : .....** **කාලය : මිනිත්තු 45**

- සෑම ප්‍රශ්නයකට ම පිළිතුරු තුන බැගින් දී ඇත. ඒවා අතුරෙන් එක් එක් ප්‍රශ්නයට අදාළ නිවැරදි පිළිතුරු තෝරා ඊට යටින් ඉරක් අඳින්න.

01) පහත දී ඇති රූපවලින් වක්‍ර රේඛා හා සරල රේඛා යන රේඛා දෙවර්ගය ම ඇති රූපය කුමක් ද?




I. II. III.

02) පෙට්ටි 4 ක්ඇති දුම්රියක් බිංගෙයක් තුළින් ගමන් කිරීමට ගත කරන කාලය අනිවාර්යයෙන් ම මිනිත්තු 13 ක් නම්, ඒ අනුව පෙට්ටි 8 ක් ඇති දුම්රියක් එම බිංගෙය තුළින් ගමන් කිරීමට ගත කරන කාලය වන්නේ,


i. මිනිත්තු 32 යි. ii. මිනිත්තු 26 යි. iii. මිනිත්තු 52 යි.

03) දී ඇති රටාවට අනුව ඊළඟට ආයුතු රූපය ඊට තෝරා යටින් ඉරක් අඳින්න.



I. II. III.

(04) දී ඇති රූප අතරින් නොගැළපෙන රූපය තෝරන්න.



I. II. III.

05. මූලින් දැක්වෙන ද්‍රව්‍ය වෙනුවට ආදේශ කළ හැකි ද්‍රව්‍යය තෝරා යටින් ඉරක් අඳින්න.

සියඹලා i. සූදුරු ii. ගොරකා iii. ගම්මිරිස්

★ පහත 6 සහ 7 ප්‍රශ්නවලින් කියවෙන පුද්ගලයා වඩාත් හොඳින් අර්ථ දක්වෙන පදය තෝරා ඊට යටින් ඉරක් අඳින්න.

(06) කුමාරසිරි දවසේ පැය විසි හතර ම වූවද නිදාගෙන සිටීමට සමතෙකි. මෙහි කුමාරසිරි


i. අලසයෙකි ii. කුම්භකර්ණයෙකි iii. රෝගියෙකි

(07) ගුණරත්න සෑම වසරක ම පාහේ වන්දනා නඩ රැගෙන වට වන්දනාවේ යයි. මෙහි ගුණරත්න,

i. රියදුරෙකි ii වෙළෙන්දෙකි iii. නඩේගුරෙකි

★ පහත රූපය බලා අංක 08 හා 09 ප්‍රශ්නවලට පිළිතුරු තෝරා යටින් ඉරක් අඳින්න.

(08) සමචතුරස්‍රවලින් සෑදී ඇති මෙම රූපයේ පෙනෙන ත්‍රිකෝණ සහිත කොටුවේ වර්ගඵලය වර්ග සෙන්ටිමීටර 4 කි. ඒ අනුව,





රූපයේ පරිමිතිය කීය ද?

i. 26 cm ii. 24 cm iii. 30 cm

(09) ප්‍රශ්න අංක 8 ට අදාළ මුළු රූපයේ වර්ගඵලය කොපමණ ද?

i. 30 $cm^2$ ii. 25 $cm^2$ iii. 20 $cm^2$

(10) පහත රූපයේ ත්‍රිකෝණ ගණන කීය ද?




i. 10 කි.
ii. 12 කි
iii. 09 කි

(11) "බසවක්කුලම" යන නමින් ප්‍රසිද්ධ වැව හඳුන්වන තවත් නාමයක් වන්නේ,

i. කලාවැව ii. තෝපා වැව iii. අභය වැව

(12) රූපයේ පාට කළ කොටස භාගයක් ලෙස දක්වෙන පිළිතුර තෝරන්න.



i. $\frac{1}{16}$ ii. $\frac{4}{12}$ iii. $\frac{2}{4}$

★ පහත 13 හා 14 ප්‍රශ්නවල හිස්තැනට වඩාත් ගැළපෙන වචනය දී ඇති පිළිතුරුවලින් තෝරන්න.

(13) | රෝගියාට : බෙහෙත් | නම් | ලිපිකරුවාට: ..... |

i. පෑන් - පැන්සල් ii. පොත්පත් iii. ලිපිද්‍රව්‍ය

(14) | කුකුළන්ට : වී ඇට | නම් | ..... : මත්ස්‍යයන් |

i. ගවයන්ට ii. පරවියන්ට iii. කොකුන්ට

(15) මැතිවරණයක දී කමල් සුනිල්ට වඩා ඡන්ද 38 ක් ලබාගත්තේ ය. දෙදෙනාට ලැබුණු මුළු ඡන්ද සංඛ්‍යාව 398 කි. කමල් සහ සුනිල් ලැබූ ඡන්ද පිළිවෙළින්,

i. 180 සහ 218 කි. ii. 218 සහ 180 කි iii. 180 සහ 178 කි

(16) රටාවේ ඊළඟට ආයුතු සංඛ්‍යා දෙක වන්නේ,

1, 4, 3, 7, 5, 10, ..... , .....

i. 7, 13 ii. 11, 15 iii. 9, 14

(17) පහත රූපයෙන් දැක්වෙන්නේ ඉලක්කම් යෙදූ ලී ඝනකයක අවස්ථා දෙකකි.




මෙම ඝනකයේ 5 ඉලක්කම යොදා ඇති මුහුණතට විරුද්ධ පැත්තේ ඇති ඉලක්කම වන්නේ,

i. 6 ii. 2 iii. 1

(18) නිශ්චිත උෂ්ණත්වයක් තුළ බේකරියක පාන් ගෙඩියක් පිළිස්සීමට මිනිත්තු 30 ක් ගතවේ. එවැනිම උෂ්ණත්වයක් තුළ පාන් ගෙඩි 20 ක් එකවර පිළිස්සීමට ගතවන කාලය කොපමණ ද?

i. මිනිත්තු 600 ii. මිනිත්තු 60 iii. මිනිත්තු 30

(19) දැඩි නියඟයකට පසු වෙසක් මාසය උදාවත් ම ශ්‍රී ලංකාවට වර්ෂාව ඇද හැලීමට පටන් ගන්නා ලදී. මිනිසුන් විසින් ඉවත ලන යෝගට් කෝප්ප, තැඹිලි කෝම්බ ආදිය වර්ෂාව උදාවීමත් සමඟ මදුරුවන්ගේ රජ දහන් වෙයි. මෙම තත්ත්වය තුළ ඩෙංගු රෝගය ලංකාවේ සීඝ්‍රයෙන් ව්‍යාප්ත වීමට වැඩි ඉඩකඩක් ඇති බවට සෞඛ්‍ය අමාත්‍යාංශය අනතුරු අඟවයි.


මෙම ප්‍රවෘත්ති වාර්තාවට වඩාත් සුදුසු මාතෘකාවක් වන්නේ,

i. නියඟය අවසන් වූ බවයි.

ii. කාලගුණ දෙපාර්තමේන්තුව නිකුත් කළ ඩෙංගු වාර්තාවක් බවයි.


iii. ඩෙංගු රෝගය ව්‍යාප්ත වීමේ අවදානම පිළිබඳ සෞඛ්‍ය අමාත්‍යාංශය නිකුත් කළ නිවේදනයක් බවයි.

(20) A, B හා C යන වෘත්ත කොටස් තුළ ඇති ඉලක්කම්වලින් විශාල ම ඉලක්කම් භාවිත කර සෑදිය හැකි කුඩා ම සංඛ්‍යාව කුමක් ද?




i. 853 ii. 358 iii. 835

(21) මෙම රූපයේ ඇති සෘජුකෝණයක් සහිත ත්‍රිකෝණ ගණන කීය ද?




i. 3 ii. 7 iii. 10

(22) කුරුඵු රංචුවක සිටින කුරුල්ලන්ගේ හොටවල් හා පාද සංඛ්‍යාවේ එකතුව 30 කි. එම රංචුවේ සිටින මුළු කුරුල්ලන් සංඛ්‍යාව කොපමණ ද?

i. 10 ii. 20 iii. 30

(23) රූපයේ ඇති සෘජුකෝණාස්‍ර හා ත්‍රිකෝණ ගණන පිළිවෙලින් දැක්වෙන්නේ,



i. 3, 4 ii. 2, 4 iii. 2, 6

(24) **තොරතෝංචියක් නැතිව** කැගසන **සියොතුන්ගේ** හඬ නිසා වනය දෝංකාර දෙන්නට විය. මෙහි තද කළු අකුරෙන් දක්වා ඇති පද දෙකේ අර්ථය සඳහන් පිළිතුර වන්නේ,

i. විලාප, රැහැයියන්ගේ ii. කෙළවරක් නැතිව, පක්ෂීන්ගේ

iii. භයංකාර, සිංහයින්ගේ

(25) නායයෑමේ බෙදවාචකයට ගොදුරු වූ අවතැන් වූවන් නේවාසික කඳවුරුවලට යොමු කරන ලදී. මේ අනුව අවතැන් වූවන් කඳවුරු ගත කිරීමට සිදුවූයේ,

i. නියඟයක් සමඟ ii. වර්ෂාවත් සමඟ iii. සුළි සුළඟක් සමඟ

★ **26 හා 27 ප්‍රශ්නවල දැක්වෙන පදය සමඟ සම්බන්ධතාවක් නැති දේ සොයා යටින් ඉරක් අඳින්න.**

(26) විවාදය .....

i. කටිකයෝ ii. තර්ක විතර්ක iii. කඩුකිණිසි

(27) සංචාරය

i. ලී දඬු ii. ඇඳුම් පැළඳුම් iii. මාර්ග සිතියම්

(28) සෙනරත්ගේ උපන් දිනය 2018.01.02 දිනට යෙදී තිබුණි. ඒ අනුව ඔහු උපන් වර්ෂයට අයත්වන දශකය හා සියවස වන්නේ,

i. 1, 20 ii. 2, 21 iii. 2, 20

(29) බානෙන් බැඳි රජරට පෙදෙසින්නේ - කෝච්චියේ හිරගෙයි ලැග එන්නේ, මෙහි බානනෙන් යනුවෙන් අදහස් වන්නේ,

i. රංචුව ii. තුන්කම්ටුව iii. යුගලය

(30) පෑන් 2 ක හා පැන්සල් 3 ක මිල රුපියල් 66 කි. පෑන් 3 ක හා පැන්සල් 2 ක මිල රුපියල් 69 කි. පෑන් 5 ක සහ පැන්සල් 5 ක මිල කීය ද?

i. රුපියල් 135 ii. රුපියල් 140.00 iii. රුපියල් 145.00

(31) "හිස රුදාවට කොට්ටය මාරු කළා වගේ" යන කියමනට වඩාත් ගැළපෙන ප්‍රකාශය වන්නේ?

i. රෝගයට නුසුදුසු ප්‍රතිකාරයන් කිරීම


ii. හිසරුදාවට කොට්ටය හිසට තැබීම හොඳ ප්‍රතිකාරයක් බව

iii. යම් ගැටලුවක් සඳහා නොගැළපෙන පිළියමක් යෙදීම

(32) විදුහල්පති → සිසුන් නම්,
වෛද්‍යවරයා → ?

i. කම්කරුවන් ii. හෙදියන් iii. රෝගීන්

(33) කඩදාසියක් දෙවරක් නමා තිත් ඉරි දිගේ කපා ඇති අයුරු රූපයේ දැක්වේ. ඒ අනුව ලැබිය හැකි නිවැරදි රූපය වන්නේ,



i. ii. iii.

(34) "තමාට පුරුදු නැති දෙයක් කරන්නට ගොස් අමාරුවේ වැටීම" ප්‍රකාශයට වඩාත් උචිත වන්නේ,

i. අමු කැවිල වගේ

ii. අබරා සිල් ගත්තා වගේ

iii. අඬුව තිබිය දී අත පුලුස්සා ගත්තා වගේ

(35) පහත දී ඇති ප්‍රකාශ අතුරින් සිදුවිය නොහැකි ප්‍රකාශය තෝරන්න.

i. කුසගින්නේ සිටි මුවෙක් හාවෙකු පසුපස එළවා ගොස් අල්ලාගෙන මරා කෑම.

ii. මෙවර ගංවතුර නිසා කුඹුරු පාළු වීම.

iii. මහතුන් මුදලාලිගේ මල්ලී පරිත්‍යාගශීලි කෙනෙකි.

★ පහත ඡේදය කියවා 36 හා 37 ප්‍රශ්නවලට නිවැරදි පිළිතුරු තෝරා යටින් ඉරක් අඳින්න.

දීප්තිමත්ව පැවති හිරු මුහුදු පතුළ සිපගන්නට ආසන්නය. මේ වෙරළේ මට දැඩි සනීපයක් දැනේ. සීත සුළං ගත සිපගෙන අවුත් මුහුදු රැළිවල ගැටී දියඹට ඇදී යන්නේ සිත ප්‍රබෝධයට පත් කරවමිනි. පක්ෂීන් ද ඈත අහසේ පියාසලන්නේ ඉතා සතුටිනි.

(36) මෙම ඡේදයෙන් විස්තර කෙරෙන්නේ දවසේ කුමන කාලයක් පිළිබඳව ද?

i. සවස් කාලය ii. දහවල් කාලය iii. උදේ කාලය

(37) මෙහි සඳහන් නැනැත්තා සිටිනුයේ කුමන ස්ථානයක ද?

1. මුහුදු වෙරළ අසල ය. 2. ගඟක් අසල ය. 3. කිව නොහැක

★ පහත සඳහන් ප්‍රකාශ අතුරින් පුද්ගලික මතවාදයන් (පුද්ගලික අදහස්) ලෙස සැලකිය හැකි වාක්‍ය තෝරා යටින් ඉරක් අඳින්න.

(38) i. දුම වාතයට එකතු වී පරිසරය පුරා පැතිර යයි.

ii. දුම්බීම පිළිකා ඇතිවීමට හේතුවක් වෙයි.

iii. රවිදු පාසලට නොපැමිණියහොත් ගුරුතුමිය දඬුවම් කරයි.

(39) රජයේ පාසල් සියල්ල ම වසා දැමුවහොත් සිදුවිය හැකි ප්‍රබල ම හානිය වන්නේ මින් කුමක්ද?

i. පාසල් ගොඩනැගිලි හා උපකරණ විනාශ වී යාම.

ii. ඉගෙන ගැනීම සඳහා පෞද්ගලික ආයතනවලට මුදල් ගෙවීමට සිදුවීම.

iii. දුප්පත් ළමයින්ට ඉගෙන ගැනීමට තිබුණු අවස්ථාව නැති වී යාම

★ යටින් ඉරි ඇඳි වචනවලට පිළිවෙළින් ආදේශනය කළ හැකි වචන යුගලය තෝරා යටින් ඉරක් අඳින්න.

(40) <u>වියත්</u> හු <u>අමන</u> බසින් නොසැලෙති.

i. උගත්තු - මෝඩ ii. උගත්තු - බොරු iii. උගත්තු - උමතු

**බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ ප්‍රාථමික අංශයේ ප්‍රකාශනයකි.**

**5 ශ්‍රේණිය ශිෂ්‍යත්ව පෙරහුරු පරීක්ෂණය 2018**

**ප්‍රශ්න පත්‍ර අංක 01 - II පත්‍රය**

**විභාග අංකය : .....** **කාලය : පැය 1යි මිනිත්තු 15**

සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

01) පහත සඳහන් ඡේදය හොඳින් කියවන්න. අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු ලියන්න.

වාද්‍ය කාලයට ගොවියෝ ගොයම් කපති. උඩැක්කි තාලයට නටමින් ගොයම් කපන විට විචිත්‍ර බවක් දිස්වේ. එකෙක් නැගිට ගොස් වතුර කළ ගෙඩිය හිස මත තබා ගෙන ගොයම් කපන්නට වූයේ සර්කස්කාරයන් සිහි ගන්වමිනි. තාලය වෙනස් විය. කෙතෙහි සරඹ සන්දර්ශනයක සිරි පළ විය.
ගොයම් කපා අවසන් කළ ගොවියෝ, හිස රැඳි සුම්බරේ ගලවා රෙදිකඩ අතට ගෙන හේරත්හාමි ළඟට පැමිණ ආචාර කොට රජ ඇළ දෙසට ගමන් ගත්හ.

i. ප්‍රාණවාචී බහුවචන ක්‍රියා පදයක් තෝරා ලියන්න.

.....

ii. "ආරම්භ කළ" යන්නට විරුද්ධාර්ථ පදය ලියන්න.

.....

iii. ගොවියෝ ගොයම් කපන්නේ කුමන තාලයට ද?

.....

iv. සුම්බරේ යනුවෙන් අදහස් කරන්නේ කුමක් ද?

.....

v. "වාද්‍ය තාලයට ගොවියෝ ගොයම් කපති." මෙම වැකිය අතීත කාලයට හරවා ලියන්න.

.....

vi. "ඇළ" යන පදයට යොදා ඇති විශේෂණ පදය ලියන්න.

.....

02) අක්ෂර වින්‍යාසය අනුව නිවැරදි වචනය තෝරා ඊට යටින් ඉරක් අඳින්න.

i. විශ්වවිද්‍යාලය / විෂ්වවිද්‍යාලය

.....

ii. පස්පවු / පස්පව්

.....

03) පහත සඳහන් වාක්‍ය සම්පූර්ණ කිරීමට සුදුසු වචනය වරහන් තුළින් තෝරා ඊට යටින් ඉරක් අඳින්න.

i. හාවා දෙඇස් පියා ..... (ගත්තෝ ය. / ගත්තේය.)

ii. ගුවන් විදුලියෙන් ළමා ගායිකාවකගේ ගී රාවය ..... (ඇසුණි. /ඇසුණේය.)

iii. ගංගා තාලයට ගලා ..... (බසිති. / බසියි.)

iv. සමහර කුඩා සත්තු ජබුෑ හඬින් දියට ..... (පනියි./පනිති.)

04) කොටුව තුළ ඇති වචනවලින් පාපිල්ල යෙදී ඇති වචනය තෝරා ලියන්න.

| |
|---|
| හැලප |
| රූපියල |
| ක්‍රමය |

.....

05) පහත සඳහන් ප්‍රස්තාව පිරුළ සම්පූර්ණ කරන්න.

i. කපන්නට බැරි අත ..... වගේ

06) පහත දී ඇති අදහසට ගැළපෙන තනි වචනය තිත් ඉර මත ලියන්න.

ii. රජතුමා රාජ සභාවේ හිඳ ගන්නා ආසනය .....

07) පහත සඳහන් වගන්තිවල හිස්තැනට සුදුසු පිළිතුර වරහන් තුළින් තෝරා ඊට යටින් ඉරක් අඳින්න.

i. සුදු නෙළුම්, රන් නෙළුම්, මානෙල් - ඕලු, කුමුදු මල් පිපී ඉතා සුන්දර ය. මෙහි ඇති මල් වර්ග හඳුන්වන්නේ ..... (ලද පස්මල් / පස් පියුම්) යනුවෙනි.

ii. වැවක ජලය පාලනය කිරීම සඳහා තැනූ දොරටුව ..... (සොරොව්ව / බිසෝකොටුව) යනුවෙන් හැඳින්වේ.

iii. නැන්දා ගෙදර පඩි පාරට කැපෙන බැවින් ..... (ගීතිකා/වස්යාදිනි) කියයි.

08) පහත සඳහන් කවි පදය සම්පූර්ණ කරන්න.

අත දෙමින් නැවත වට පිටින් බලති නෙක

.....

09) මිණි මුතු කහවණු සම්පත් ගෙන දෙයි
ජල උල්පත් මහ පොළොවෙන් මතු වෙයි
දුව දඬු රත් පස මතු පිට පැළ වෙයි
මේ පින් බිම සුරකුම යුතුකම වෙයි

(පද රචනය - රෝහිනී චිත්‍රලතා)

ඉහත කවියෙහි අපේ මව්බිමෙහි පොළොව ඉතා සරු සාර බව ප්‍රකාශ වෙයි. එම පද පේළිය උපුටා තින් ඉර මත ලියන්න.

.....

10) පහත සඳහන් වාක්‍ය ලිඛිත භාෂාවට හරවා ලියන්න.


බල්ලෙක් ඇය පස්සෙන් ආවා.

..... (1 x 21 = 21)

11) පහත දී ඇති ඉංග්‍රිසි වචනය සඳහා යෙදෙන සිංහල වචනය ලියන්න.

i. Hands - .....

ii. රූපයේ දී ඇති වාහනය සඳහා ඉංග්‍රීසි භාෂාවේ යෙදෙන වචනය ඉංග්‍රීසි අකුරෙන් ලියන්න.



.....

12) පහත දී ඇති ඉංග්‍රීසි වගන්තිවල හිස්තැනට සුදුසු වචනය වරහන් තුළින් තෝරා ඊට යටින් ඉරක් අඳින්න.

i. This ..... (is / are) my bag.
ii. What ..... (is / do) you like ?

13) පහත සඳහන් වාක්‍ය ඉංග්‍රීසි භාෂාවෙන් කියන ආකාරය ඉංග්‍රීසි අකුරුවලින් ලියන්න.
මම හොඳින් ඉන්නවා - .....

( 1 x 5 = 5)

14) පහත සඳහන් දෙමළ ගී පදයෙහි කියවෙන සතාගේ නම සිංහලෙන් ලියන්න.

කුදිත්තුක් කුදිත්තෝ ඔඩුම්

කුදිරෙරෙ අදෝ පාරායි .....

15) පහත සඳහන් වාක්‍ය දෙමළෙන් කියන ආකාරය සිංහලෙන් ලියන්න.

නාන් කුළික්කට්ටුමා ? ..... ( 2 x 2 - 4)

16) නාත්තා උදෙන්ම ගොවීන් සමඟ කුඹුරට ගියේ ය. අම්මාත් මමත් හීල් ඇඹුල රැගෙන කුඹුරට ගියෙමු. ..... අපේ කුඹුරේ ගොයම් කැපුදා යන මාතෘකාව යටතේ වාක්‍ය තුනක් ලියන්න. (සෑම වාක්‍යකම වචන පහකට වඩා වැඩියෙන් තිබිය යුතුයි. උක්ත / ආඛ්‍යාත සම්බන්ධය හා අක්ෂර වින්‍යාසය නිවැරදි විය යුතුය.)

1. .....

2. .....

3. .....

( 2 x 3 = 6)

17) දී ඇති තිත් ඉර මත පිළිතුර ලියන්න.

9 099 ට දහයක් එකතු කළ විට ලැබෙන පිළිතුර අකුරෙන් ලියන්න.

.....


18) දී ඇති ඉලක්කමේ දෙගුණය රෝම සංඛ්‍යාවෙන් ලියන්න.

vi - .....

19) "සනකයක" ඇති සමාන මුහුණත් යුගල ගණන කීයද?

.....

20) මෙම රූපයේ $\frac{1}{4}$ ක් අඳුරු කරන්න.



21) රූපයේ දක්වා ඇති සෘජුකෝණාස්‍රයේ ඇති සියලුම සමමිතික අක්ෂ ඇඳ දක්වන්න.



22) එක් පෙට්ටියක සබන් කැට 9 බැගින් සබන් කැට 963 ක් ඇසිරීමට පෙට්ටි කීයක් අවශ්‍යද? ..... ( 2 x 5 = 10)

23) රාත්‍රී 9.30 ට කොළඹින් පිටත් වූ බස් රථය පැය 04:00 ට මහනුවරට ළඟා විය.

i. බස් රථය මහනුවරට ළඟා වීමට ගත වූ කාලය කොපමණ ද? .....

ii. බස් රථය පිටත් වූ වේලාව පැය 24 ඔරලෝසු වේලාවෙන් දක්වන්න.

.....

24)

| | |
|---|---|
| **201** | **403** |
| **303** | **219** |

කොටුව තුළ ඇති සංඛ්‍යාවලින් 2 ක් එකතු කර ලැබෙන පිළිතුරට තව 15 ක් එකතු කළ විට 619 ලැබේ. එම සංඛ්‍යා දෙක තෝරා ලියන්න. .....

25) උතුරු දිශාවට මීටර 30 ක් ගමන් කළ රමණී තම දකුණු අත පැත්තට හැරී තවත් 25m ගමන් කර නතර වෙයි.


i. ඇය දැන් සිටින්නේ මුලින් සිටි ස්ථානයට කුමන දිශාවෙන් ද? .....

ii. රමණී ගමන් ආරම්භ කළ ස්ථානයෙන්ම ගමන ආරම්භ කළ සුමුදු ගමන් කළේ දකුණු දිශාවට 10 m ක්ය. දැන් දෙදෙනා අතර දුර කොපමණ ද?

.....

26) මෙම රූපයේ ඇති චතුරස්‍ර සංඛ්‍යාව කීය ද?


.....



27) i. මෙහි දක්වෙන සම්පූර්ණ රූපයේ පරිමිතිය කීය ද? .....

ii. අඳුරු කර ඇති කොටස කපා ඉවත් කළේ නම් ඉතිරි කොටසේ වර්ගඵලය සොයන්න.

.....




28)


| ද්‍රව්‍ය | ප්‍රමාණය | මිල රුපියල් |
|---|---|---|
| සීනි | 1 kg | 108.00 |
| සබන් | කැට 1 | 45.50 |
| පොත් | 1 ක් | 35.00 |
| මකන කැබලි | 1 ක් | 8.00 |

i. ඉහත ද්‍රව්‍ය සියල්ල මිලට ගත්තේ නම් ගෙවිය යුතු මුදල කීයද? .....

ii. එම ද්‍රව්‍ය මිලට ගත් නයනා කඩයට රුපියල් 100 නෝට්ටු තුනක් දුන්නේ නම් ඇයට ලැබෙන ඉතුරු මුදල කීය ද? ..... ( 2 x 10 = 20)

29) පරිප්පු 3 kg 250 g ප්‍රමාණයක් නැවත සමාන ප්‍රමාණයේ කුඩා පැකැට්ටු 13 ක් සෑදුවේ නම් කුඩා පැකැට්ටු 3 ක බර කොපමණද? .....

30) වෙළෙඳ සැලක තිබූ පළතුරු ප්‍රමාණය මෙම ප්‍රස්තාරයේ දැක්වේ.




i. වෙළෙඳ සැලේ තිබූ අඹ ගෙඩි ප්‍රමාණය වෙරළු ගෙඩි ප්‍රමාණයෙන් හරි අඩක් නම් එම ප්‍රමාණය ප්‍රස්තාරයේ දක්වන්න.

ii. වෙළෙඳ සැලේ තිබුණු මුළු පලතුරු ප්‍රමාණය කොපමණ ද?
.....

iii. වෙළෙඳ සැලේ තිබූ රඹුටන් ප්‍රමාණයෙන් $\frac{2}{5}$ ක් විකුණුවේ නම් ඉතිරි රඹුටන් ප්‍රමාණය කොපමණ ද? ..... ( 1 x 4 - 4)

★ **ප්‍රශ්න අංක 31 සිට 60 තෙක් එක් එක් ප්‍රශ්නයට සුදුසු පිළිතුර තෝරා ඊට යටින් ඉරක් අඳින්න.**

31) උපදේශාත්මක කවි ඇතුළත් ග්‍රන්ථයක් වන්නේ,
1. යසෝදරාවත
2. ගුත්තිල කාව්‍ය
3. සුභාෂිතය
4. මඩොල්දූව

32) ශ්‍රී ලංකාවට ආවේණික සතෙක් නොවන්නේ,
1. රම්බෙල්ලා
2. කැහිබෙල්ලා
3. පොල්කිච්චා
4. හික්මීයා

33) පියාපත් විනිවිද පෙනෙන සතෙකි.
1. කපුටා
2. කැරපොත්තා
3. වන්දා
4. බත්කුරා

34) පූසාගේ හඬ අනුකරණය කළ හැකි පක්ෂියෙකි.
1. කවුඩා
2. කපුටා
3. මයිනා
4. ගිරවා

35) දේදුන්නේ දැකිය නොහැකි වර්ණය,
1. කළු
2. දම්
3. ඉන්ඩිගෝ
4. කොළ

36) පෘථිවියට ආසන්නම ග්‍රහලෝකය වන්නේ,

1. බුධ 2. අඟහරු 3. බ්‍රහස්පති 4. සිකුරු

37) ශ්‍රී ලංකාවේ ලුණු ලේවායක් පිහිටි නගරය වන්නේ,

1. ගාල්ල 2. ත්‍රිකුණාමලය 3. හම්බන්තොට 4. කොළඹ

38) ශ්‍රී ලංකාවේ පිහිටීම සම්බන්ධයෙන් වැරදි ප්‍රකාශය තෝරන්න.

1. ශ්‍රී ලංකාව ඉන්දියාවට දකුණින් පිහිටි රටකි.
2. ශ්‍රී ලංකාවට උතුරු දෙසින් මැලේසියාව පිහිටා ඇත.
3. ශ්‍රී ලංකාව වටා ඉන්දියන් සාගරය තිබේ.
4. ශ්‍රී ලංකාවට උතුරින් පිහිටි රටකි ඉන්දියාව

39) පහත සඳහන් බීජ අතරින් වඩාත් ඉක්මනින් පැළවන බීජය කුමක්ද?

1. සියඹලා 2. මිරිස් 3. මුං 4. දඹල

40) රාත්‍රියේ දී ගමන් කරන විට දිශාව සොයා ගැනීමට උපකාර වන තරු රටාව,

1. දකුණු කුරුසය 2. ඔරායන් 3. මහබල්ලා 4. කුඩා වලසා

41) පැගිරි තෙල් ඇගේ තවරා ගැනීමෙන් අපට ආරක්ෂා විය හැකි කෘමි සත්වයා,

1. කැරපොත්තා 2. මැස්සා 3. මදුරුවා 4. කුරුමිණියා

42) නොයෙක් බීජ ආශ්‍රයෙන් කරනු ලබන නිර්මාණය හඳුන්වන්නේ,

1. කොලාජ් 2. ස්ටෙන්සිල් 3. සැරසිලි 4. අල්පනා

43) ආහාර රසවත් කිරීමට මෙම ශාකයේ පොතු යොදා ගනියි.

1. පාවට්ටා 2. වෙනිවැල් 3. කරපිංචා 4. කුරුඳු

44) අපිරිසිදු ජලය පානය කිරීමෙන් සෑදිය හැකි රෝගයකි.

1. සෙංගමාලය 2. දියවැඩියාව 3. ගලගණ්ඩය 4. මහාමාරිය

45) මින්නේරිය වැව කරවන ලද්දේ,

1. මහා පරාක්‍රමබාහු රජතුමා 2. ධාතුසේන රජු
3. මහසෙන් රජු 4. අභය රජු

46) තම රැකියාවේදී නිළ ඇඳුමක් භාවිත නොකරන පුද්ගලයෙකි,

1. ලියුම් බෙදන්නා 2. මනු කියවන්නා
3. මහජන සෞඛ්‍ය පරීක්ෂක 4. ආරක්ෂක නිලධාරියා

47) කැටපත් පවුර පිහිටි ස්ථානය වන්නේ,

1. සීගිරිය 2. දළදා මාලිගාව 3. බුදුරුවගල 4. පාහියන්ගල

48) ඇතුගල් පුරවරය ලෙස හඳුන්වනු ලබන නගරය,
1. අනුරාධපුරය 2. අත්තනගල්ල 3. පනාමුරය 4. කුරුණෑගල

49) වරක්කලය භාවිත කරන කර්මාන්තය වන්නේ,
1. පෙදරේරු කර්මාන්තය 2. කුඹල් කර්මාන්තය
3. වඩු කර්මාන්තය 4. ධීවර කර්මාන්තය

50) බොත්තම් කාසයක් මැසීමට යොදාගත හැකි මැහුම් ක්‍රමය,
1. දම්වැල් මැස්ම 2. බිලැන්කට් මැස්ම 3. කතිර මැස්ම 4. හුරුළුකටු මැස්ම

51) ශ්‍රී ලංකාවේ පැරණි මානවයා ජීවත් වූ ප්‍රදේශය ලෙස සැලකේ.
1. ඇඹිලිපිටිය 2. අම්බලන්ගොඩ 3. අනුරාධපුරය 4. බලංගොඩ

52) නිවැරදි චුම්බක ආකර්ෂණය සිදුවන්නේ,

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| N | N | S | S | N | S | S | W |

1. 2. 3. 4.

53) ඩීසල් මගින් ක්‍රියා කරන අත් ට්‍රැක්ටරයේ දැකිය හැකි විශේෂිත රෝදයකි.
1. ලොකු රෝදය 2. කැස්ටර් වීල් 3. අමතර රෝදය 4. ගුරු රෝදය

54) කිරි කොරහා නම් නර්තනය චාරිත්‍රයක් ලෙස සිදු කරනු ලබන ජන වර්ගය,
1. ද්‍රවිඩ ජනයා 2. සිංහල ජනයා 3. ආදි වාසීන් 4. මුස්ලිම් ජනයා

55) විද්‍යුත් චුම්භකයක් සකස් කර ගැනීමට අවශ්‍ය නොවන දෙයකි,
1. කොයිල් කම්බි 2. චුම්භකය 3. යකඩ ඇණය 4. වියලි කෝෂය

56) දොන් පුල්ලේ වෙදරාල යනුවෙන් හැඳින්වූයේ,
1. මොනරවිල කැප්පෙට්ටිපොල තුමා 2. වීර පුරන්අප්පු
3. ගොංගාලේගොඩ බණ්ඩා 4. මද්දුම බණ්ඩාර

57) එස්.මහින්ද හිමියන් විසින් රචිත අවසාන කෘතිය වන්නේ,
1. ලංකා මාතා 2. ශ්‍රී පාදය 3. ඔවාමුතුදම 4. නිදහසේ මන්ත්‍රය

58) සන්නිවේදන මාධ්‍ය අතුරින් ශ්‍රව්‍ය මාධ්‍යයකි,
1. රූපවාහිනිය 2. පුවත්පත 3. සඟරා 4. ගුවන් විදුලිය

59) ප්‍රෝටීන් සහිත ආහාර වර්ගයක් ලෙස හැඳින්විය හැක.
1. අඹ 2. දඹල 3. බත් 4. වට්ටක්කා

60) කෘමීන්ගෙන් වගාව ආරක්ෂා කර ගැනීමට රසායනික පොහොර වෙනුවට භාවිත කරන සාම්ප්‍රදායික ක්‍රමයකි.
1. කොහොඹ දියර ඉසීම 2. කිසිවක් නොයෙදීම
3. කෘමිනාශක යෙදීම 4. රසායනික දියර භාවිතය

( 1 x 30 = 30)